# HDFC බැංකුව

දශක හතරක කාලයක් පුරා විවිධ මූල්‍ය විසඳුම් හරහා සුවහසක් ශ්‍රී ලාංකිකයන්ගේ හිසට සෙවණක් මෙන්ම ව්‍යාපාරික ප්‍රජාවට මූල්‍ය සහාය සපයමින් දැයේ අභිවෘද්ධිය උදෙසා කැප වන බැංකුවක් සමඟ ඔබේ බැංකුකරණ වෘත්තීය උසස් තලයකට ගෙන ඒමට මහඟු අවස්ථාවක් උදා වී ඇත.

**HDFC** බැංකුවෙහි පහත සඳහන් තනතුරු සඳහා දක්ෂ, ක්‍රියාශීලි සහ සුබවාදී දැක්මක් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## දත්ත පද්ධති පරිපාලක (පුරප්පාඩු 02කි)

**මූලික වගකීම්**

- වගු අවකාශ, වගු හා දර්ශක නිර්මාණය කිරීම, වරප්‍රසාද සැකසීම හා පරිශීලක පිවිසුම් නිර්මාණය කිරීම.
- Oracle Data Guard හි අනුකරණ අධීක්ෂණය කිරීම.
- දත්ත පද්ධති සකස් කිරීම සහ ලැබෙන ඉල්ලීම් අනුව ඒවා පරීක්ෂා කිරීම.
- RMAN සහ EXPDP හි දෛනික උපස්ථ සම්පූර්ණ වූ බව සහතික කිරීම.
- DB පැච් සහ පිටපත් යෙදීම.
- DBMS උපලේඛන කාර්ය අධීක්ෂණය.
- දර්ශක නැවත ගොඩනැගීම සහ සංඛ්‍යා ලේඛණ එකතු කිරීම.
- Oracle Tuning Advisor, AWR සහ ADDM භාවිතයෙන් කාර්ය සාධන සුසර කිරීම.
- EM කොන්සෝල නිරීක්ෂණය කිරීම.
- දත්ත සමුදාය පරිපාලන කාර්යය ස්වයංක්‍රීයකරණය සඳහා ලිනක්ස් ෂෙල් පිටපත් රචනා කිරීම.
- පැකේජ සහ ගබඩා කර ඇති ක්‍රියා පටිපාටි නිදොස් කිරීම සඳහා අවශ්‍ය PL/SQL දැනුම තිබීම.
- දත්ත සමුදාය අධීක්ෂණය කිරීම.
- Oracle Data Guard මාරු වීම සහ Snapshot මාදිලිය.
- HDFC බැංකුවේ දත්ත සමුදාය වැඩි දියුණු කිරීමට, ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කිරීමට සහ සමස්ත දත්ත ගබඩාවේ අඛණ්ඩතාව හා ආරක්ෂාව සහතික කිරීමට සහාය වීම.

**අවශ්‍ය සුදුසුකම්**

- වසර 4ක පළපුරුද්ද සමඟ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම.
  හෝ
  Oracle DBA OCA වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම සහ අවම වශයෙන් වසර 5ක පළපුරුද්දක් ලබා තිබීම.
  හෝ
- තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර 10ක පළපුරුද්දක් ලබා තිබීම සහ Oracle DBA පිළිබඳ පළපුරුද්ද ලබා තිබීම.

  පහත සඳහන් Oracle දත්ත පද්ධති කළමනාකරණයේ හැකියාව තිබිය යුතුය.
    - උපස්ථ සහ ප්‍රතිසාධන අවශ්‍යතා.
    - සම්පත් කළමනාකරණය.
    - කාර්යසාධනය සුසර කිරීම සහ නිරීක්ෂණය කිරීම.
    - Oracle උපයෝගිතා සහ මෙවලම් භාවිතය.
    - ආරක්ෂක කළමනාකරණය.
    - දත්තවල අඛණ්ඩතාව කළමනාකරණය.
- MS SQL පිළිබඳ දැනුම.
- RAC, ASM, RMAN සහ Oracle WebLogic පිළිබඳ දැනුම.
- අභ්‍යන්තරයේ පවතින මෙහෙයුම් පද්ධතිය සහ භෞතික සැළසුම් පිළිබඳ මනා අවබෝධයක් තිබීම.

- ක්‍රියාත්මත කර ඇති පද්ධති පිළිබඳ දැනුම තිබීම.
- දත්ත කළමනාකරණය පිළිබඳ දැනුම තිබීම.

**වයස් සීමාව**

- වයස අවුරුදු 45ට අඩු වීම වඩාත් සුදුසු වේ.

තෝරා ගන්නා අපේක්ෂකයින් සුදුසුකම් මත **ශ්‍රේණි** ගත කර ස්ථාවර පදනම මත හෝ වෙළඳපල මත පදනම් වූ ආකර්ෂණීය වැටුප් සහ දීමනා සමගින් ස්ථාවර කාලීන කොන්ත්‍රාත් පදනම මත හෝ බඳවා ගනු ලැබේ.

## සහාය ඉන්ජිනේරු (තොරතුරු තාක්ෂණ)

**වගකීම්**

- පර්යේෂණ කිරීම, ගැටලු නිර්ණය කිරීම, දෝෂ නිරාකරණය කිරීම සහ නිවැරදි හා කාලෝචිත ආකාරයෙන් පාරිභෝගික ගැටලුවලට විසඳුම් සැපයීම.
- විවිධාකාරයේ පද්ධති, මෘදුකාංග සහ දෘඩාංග සමඟ කටයුතු කිරීම.
- සුදුසු අභ්‍යන්තර දෙපාර්තමේන්තු වෙත නොවිසඳුණු ගැටලු යොමු කිරීම සඳහා සම්මත ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම.
- යෙදවුම් අලෙවි කරන්නන් සමඟ සමීපව කටයුතු කිරීම.
- කෙටි කාලයක් තුළ ගැටලු නිරාකරණය කිරීම.
- උපරිම සහාය ගැනීම සඳහා යටත් නිලධාරීන් පුහුණු කිරීම.
- පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණය (UAT) සඳහා ක්‍රියාකාරීව සම්බන්ධ වීම.
- යෙදවුම් හා පද්ධති සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීමට, දෝශ නිරාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීමට, සහාය ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමට සහ තාක්ෂණික ගැටළු හැසිරවීමට සහාය වීම.

**සුදුසුකම්**

- පරිගණක වැඩසටහන්කරණය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද සමඟ පරිගණක විද්‍යාව පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.
  හෝ
- පරිගණක වැඩසටහන්කරණය පිළිබඳ වසර තුනක පළපුරුද්ද සමඟ පිළිගත් ඩිප්ලෝමාවක් ලබා තිබීම. (අවම වශයෙන් වසරක කාල සීමාවක් සහිත ඩිප්ලෝමාවක් ලබා තිබීම.)
- Java, dotNet, mobile application, C# සහ Oracle SQL භාවිතා කරමින් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක මෘදුකාංග සංවර්ධනයට දායක වී තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

**වයස් සීමාව**

- වයස අවුරුදු 45ට අඩු වීම වඩාත් සුදුසු වේ.

**තනතුරට අදාළ නියමයන් සහ කොන්දේසි**

මෙම තනතුර සඳහා තෝරා ගන්නා අපේක්ෂකයන් පළමුව වසර 02ක කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා අතර යහපත් කාර්ය සාධනය මත **ශ්‍රේණිය** IV හි පිහිටුවනු ඇත.

ආකර්ෂණීය වැටුප් සහ දීමනා හිමි වේ.

## තොරතුරු ආරක්ෂණ තර්ජන විශ්ලේෂක

**වගකීම්**

- ආරක්ෂක විශ්ලේෂණ මෙවලම් භාවිතයෙන් තර්ජන සහ අවදානම් වාර්තා සකස් කිරීම.
- ආයතනික තොරතුරු වත්කම්වල ආරක්ෂක පාලන දැඩි කිරීම සහ සමාලෝචනය කිරීම.
- අවදානම්සහගත තත්ත්වයන් වාර්තා කිරීම හා විසඳුම් යෝජනා කිරීම සහ අඛණ්ඩ ආරක්ෂක ගැටලු හැසිරවීම.
- කාලානුරූපීව මාර්ගගත ආරක්ෂණ හැකියා වර්ධනය කිරීමට සහාය වීම.
- වාර්ෂික අවදානම් සහ පරීක්ෂණ අවශ්‍යතා සඳහා සහාය වීම.
- විවිධ කර්මාන්ත හා විශේෂිත කණ්ඩායම් වෙතින් එල්ල විය හැකි සයිබර් තර්ජන පිළිබඳ බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් අවශ්‍ය පූර්ව ආරක්ෂක ක්‍රියා මාර්ග ගැනීම.
- බැංකු තොරතුරු පද්ධතිවල ආරක්ෂාව සහතික කිරීම, තොරතුරුවල ආරක්ෂාව සම්බන්ධ සිදුවීම්වලට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම හා ස්වයංක්‍රීය ක්‍රම හරහා එල්ල විය හැකි ආරක්‍ෂක තර්ජන හඳුනා ගැනීමට, පාලනය කිරීමට හා වැළැක්වීමට සහාය වීම.

**සුදුසුකම්**

- තොරතුරු ආරක්ෂාව හෝ සයිබර් ආරක්ෂාව පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.
- Certified Ethical Hacker වැනි අදාළ ආරක්ෂක වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.
- සමාන තනතුරක වසර 5ක සේවා පළපුරුද්දක් තිබීම.
- අවදානම් කළමනාකරණය සහ ආරක්ෂක මෙවලම් පිළිබඳ දැනුම තිබීම.
- විශිෂ්ට විශ්ලේෂණ සහ දෝෂ නිරාකරණ කුසලතා පැවතීම.

**වයස් සීමාව**

- වයස අවුරුදු 45ට අඩු වීම වඩාත් සුදුසු වේ.

**තනතුරට අදාළ නියමයන් සහ කොන්දේසි**

මෙම තනතුර සඳහා තෝරා ගන්නා අපේක්ෂකයන් පළමුව වසර 02ක කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා අතර යහපත් කාර්ය සාධනය මත **ශ්‍රේණිය** III (2) හි පිහිටුවනු ඇත.

ආකර්ෂණීය වැටුප් සහ දීමනා හිමි වේ.

## මෘදුකාංග ඉංජිනේරු

**මූලික වගකීම්:**

- ඉංජිනේරු මූලධර්ම සහ ක්‍රමලේඛණ භාෂා පිළිබඳ දැනුම උපයෝගී කර ගනිමින් HDFC බැංකුව සඳහා මෘදුකාංග විසඳුම් ගොඩනැඟීම, පරිගණක මෘදුකාංග යෙදවුම් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම, පරීක්ෂා කිරීම හා ඇගයීමට ලක් කිරීම.
- මෘදුකාංග දෝෂ නිරීක්ෂණය කරමින් සහ ඒවා නිවැරදි කරමින් පද්ධති පවත්වා ගෙන යාම.
- නවීකරණය කළ යුතු ක්ෂේත්‍ර විශ්ලේෂණය කිරීම සහ හඳුනා ගැනීම තුළින් දැනට පවතින වැඩසටහන් සංවර්ධනය කිරීම.
- කාර්යාල හා සම්බන්ධ තොරතුරු, තාක්ෂණ ගැටලු පිළිබඳව සොයා බැලීම සහ අවශ්‍ය පරිදි ඒවා නිරාකරණය සඳහා සහාය දැක්වීම.
- අවශ්‍ය අවස්ථාවල අවසන් පරිශීලක පුහුණුව සැපයීම.

**සුදුසුකම් :**

- පරිගණක විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් සහ පරිගණක වැඩසටහන්කරණය පිළිබඳව වසර 05ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

- පරිගණක විද්‍යාව පිළිබඳව අවම වශයෙන් වසරක කාලයක් සහිතව පිළිගත් ඩිප්ලෝමාවක් සමඟ පරිගණක වැඩසටහන්කරණය පිළිබඳ වසර හයක පළපුරුද්ද ලබා තිබීම.

- Java, dotNet, Mobile Application, C# සහ Oracle SQL's භාවිතා කරමින් බැංකුකරණ / මූල්‍ය ආයතනයක මෘදුකාංග සංවර්ධනය කිරීමට දායක වී තිබීම අමතර සුදුසුකමක් වේ.

වයස : අවුරුදු 35ට අඩු වීම වඩාත් සුදුසු වේ.

**තනතුරට අදාළ නියමයන් සහ කොන්දේසි**
මෙම තනතුර සඳහා තෝරා ගන්නා අපේක්ෂකයන් පළමුව වසර 02ක කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා අතර යහපත් කාර්ය සාධනය මත **ශ්‍රේණිය** III (2) හි පිහිටුවනු ඇත.

ආකර්ෂණීය වැටුප් සහ දීමනා හිමි වේ.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය**

විද්‍යුත් පණිවිඩයේ විෂය තීරයෙහි (**Subject**) ඉල්ලුම් කරන තනතුර සඳහන් කරමින් 2024.05.29 දින හෝ එදිනට පෙර තමා පිළිබඳ විස්තර ලබා ගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුද සඳහන් කරමින් ඔබගේ ඉල්ලුම් පත්‍රය careers@hdfc.lk යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කළ යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට ඉල්ලා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා නොමැති පුද්ගලයන්ට මෙම තනතුර සඳහා අයදුම් කළ නොහැක. අදාළ සුදුසුකම් සපුරා නොමැති පුද්ගලයන්ගේ අයදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබුණු අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

සම්මුඛ පරීක්ෂණයේදී අදාළ ලිපි ගොනුවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් කිසිදු හේතුවක් මත මෙම තනතුර සඳහා පත් නොකෙරෙනු ඇත.

ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් මෙම තනතුර සඳහා නුසුදුසුකමක් ලෙස සැළැකේ.

බඳවා ගැනීම් කල් දැමීමට හෝ අවලංගු කිරීමට HDFC බැංකුවට හැකියාවක් ඇත. තෝරා ගත් අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීමේ ක්‍රමවේදයේ ඉදිරි අදියර සඳහා කැඳවනු ඇත.

**සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පාලන**
**HDFC බැංකුව**
**තැ. පෙ. 2085**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත**
**කොළඹ 02**
**දුරකථන අංකය: 0112356800 වෙබ් අඩවිය: www.hdfc.lk**